# ඓතිහාසික පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස ජාතික ලේඛනාගාරයේ වැදගත්කම


# The Importance of National Archives as an Information Centre for Historical Research

# தேசிய அரிச்சுவஷகள் சாலையின் முக்கியத்துவம் அது வரலாற்று ஆய்விற்கு தகவல் மையமாக இருப்பது.

## ජාතික ලේඛනාරක්ෂක සතිය වෙනුවෙන් නිකුත් කරන සමරු කළඹ - 1999

## Souvenir to Mark the National Archives Week - 1999

## தேசிய ஆவயங்கள் வாரத்தை நினைவ கறல்



ROYAL SIGN MANUAL


ප්‍රකාශනය
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
7, රීඩ් මාවත, කොළඹ 7.

தேசிய அரிச்சுவஷகள் கூடத்திணைக்கள வெளியீடு
இல. 7, ரீட் சாலை, கொழும்பு 7.

Publication of the Department of National Archives
7, Reid Avenue,
Colombo 7

1999

# ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා පර්යේෂණ සඳහා මූලාශ්‍ර ආයතනයක් ලෙස
# ජාතික ලේඛනාගාරයේ වැදගත්කම

පුරාවිද්‍යාව මගින් මූලික වශයෙන් කෙරෙන්නේ අතීත සමාජයේ භෞතික පාර්ශවය අධ්‍යයනය කිරීමය. පුරාවිද්‍යා ස්ථාන සහ කෘති හඳුනාගැනීම, ඒවා කාල රාමුවකට ගොනු කිරීම සහ ඒ මගින් අතීත සමාජය අර්ථ නිරූපනය කිරීම සාම්ප්‍රදායික පුරාවිද්‍යාවේ ප්‍රධාන අරමුණුය. මෙකී අරමුණු ඉටුකර ගැනීම සඳහා පුරාවිද්‍යා දත්ත ලබාගන්නේ වැඩි වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනවලිනි. ඒ හැරුණු විට, කෞතුකාගාරය, විද්‍යාගාරය, පුස්තකාලය සහ ජාතික ලේඛනාගාරය මගින් ඔහු දත්ත ලබා ගනී.

මේ අතරින්, ජාතික ලේඛනාගාරය පුරාවිද්‍යා අධ්‍යයන සඳහා මූලාශ්‍ර ආයතනයක් ලෙස වැදගත්වන ආකාරය මෙරට පුරාවිද්‍යාව සහ ජාතික ලේඛනාගාරය ආශ්‍රයෙන් පෙන්වා දීමට මේ ලිපියෙන් උත්සාහ කරනු ලැබේ. ජාතික ලේඛනාගාරය නූතන ඉතිහාසඥයාගේ ප්‍රධානතම මූලාශ්‍ර ආයතනයක් වුවද, එය පුරාවිද්‍යාඥයාගේ වැඩි අවධානයට හෝ පරිහරණයට ලක්වන බවක් නොපෙනේ. ඉතිහාසඥයා සහ පුරාවිද්‍යාඥයා යන දෙදෙනාම අතීතය අධ්‍යයනය කළද, ඔවුන්ගේ දෘෂ්ටිය සහ විධික්‍රම බෙහෙවින් වෙනස් වීම මෙයට ප්‍රධාන හේතුවිය හැකිය. ඉතිහාසඥයා බොහෝ විට ලේඛන ආශ්‍රයෙන් අතීතයේ ඓතිහාසික වැදගත්කම ගවේෂණය කිරීමට උත්සාහ දරන අතර, පුරාවිද්‍යාඥයා තැත්කරන්නේ ද්‍රව්‍යමය සාධක ඇසුරින් අතීත සමාජයේ ගලායෑම තේරුම් ගැනීමටය. මේ අනුව ජාතික ලේඛනාගාරය තුළ ඉතිහාසඥයාට ප්‍රමුඛ ස්ථානයක් හිමිවීමත්, පුරාවිද්‍යාඥයාට ද්විතීය ස්ථානයක් හිමිවීමත් ස්වභාවිකය.

අනෙක් අතට, ජාතික ලේඛනාගාරයේ ඇති ලේඛන වැඩි කොටසක් 17 වන ශත වර්ෂයට සහ ඉන් පසු කාලයට අයත් ඒවාය. මේ තත්ත්වය ද පුරාවිද්‍යාඥයා ජාතික ලේඛනාගාරයෙන් ඈත්වීම කෙරේ බලපා ඇත. මෙරට පුරාවිද්‍යාඥයන් වැඩි දෙනෙක් පැරණි සම්භාව්‍ය ශිෂ්ටාචාරය අධ්‍යයනය කිරීමට රුචිකමක් දක්වයි. ඔවුහු අතීතයේ මෑතකාලීන සියවස් කීපය "අතීතය" ලෙස නොදකිති. එම යුගය අධ්‍යයනය කරන කීපදෙනා වුව වැඩි වශයෙන් නැඹුරුවී ඇත්තේ විහාර චිත්‍ර හෝ ගොඩනැගිලි ආකෘති අධ්‍යයනය කිරීමට ය.

මෙකී හේතුන් හැරුණු විට පුරාවිද්‍යාඥයා ජාතික ලේඛනාගාරයෙන් ඈත් කිරීම සඳහා වෙනත් බාහිර හේතුන් කිහිපයක් ද බලපා තිබේ. ඒ අතර ප්‍රධාන වන්නේ මෙරට වත්මන් පුරාවිද්‍යාඥයින් වැඩි දෙනෙකු තුළ ලේඛන පරිහරණය කිරීමට තරම් ශික්ෂණයක්, ඇල්මක් හෝ විවේක බුද්ධියක් නොමැතිකමය. ජාතික ලේඛනාගාරය තබා, සාමාන්‍ය පුස්තකාලයක්වත් නිතර පරිහරණය කරනු පුරාවිද්‍යාඥයකු අද දැකගත හැකි නම් ඒ ඉතා කලාතුරකිනි. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාව කෙතරම් ප්‍රමාණාත්මකව ප්‍රසාරණය වී ඇතත්, එහි ගුණාත්මක වර්ධනය මන්දගාමී වීමට මේ තත්ත්වය බෙහෙවින් බලපා ඇති බව සඳහන් කළ යුතුය.

පවතින තත්ත්වය මෙය වුවද, ජාතික ලේඛනාගාරය සතු ඓතිහාසික මූලාශ්‍ර ප්‍රමාණය සලකා බැලීමේදී එය මෙරට පුරාවිද්‍යාඥයාගේ විශේෂ අවධානයට ලක්විය යුතු ස්ථානයක් බව ඉතා පැහැදිලිය. ප්‍රධාන වශයෙන් මතු දැක්වෙන කාර්යයන් සඳහා ජාතික ලේඛනාගාරය පරිහරණය කිරීම පුරාවිද්‍යාඥයෙකුට අවශ්‍ය වන බව පෙන්වා දිය හැකිය.

1. පුරාස්ථාන, පුරාකෘති සහ පුරාසමාජය පිළිබඳව පුරෝගාමී අධ්‍යයනයන්ගේ තොරතුරු ලබා ගැනීම

2. ස්ථාපිත පුරාවිද්‍යා ආයතනයන්ගෙන් පරිබාහිරව වර්ධනය වූ පුරාවිද්‍යා අධ්‍යයන ක්ෂේත්‍රයන් පිළිබඳව හැදෑරීම

3. ප්‍රාග් නූතන සහ නූතන යුගයේ පුරාවිද්‍යාව හැදෑරීම

4. පුරාවිද්‍යා විෂයයයේ ඉතිහාසය ගොඩනැගීම

පුරාවිද්‍යාඥයෙකුට ක්ෂේත්‍ර අධ්‍යයන මගින් පමණක් ප්‍රමාණවත් දත්තව ලබා ගැනීම ඇතැම් විට අසීරුය. එබැවින් ඔහු පූර්ව පර්යේෂකයන් විසින් එම ස්ථානවල කරනලද කටයුතු පිළිබඳව සොයා බැලිය යුතුය. මෙවැනි අවශ්‍යතාවයක් සඳහා ජාතික ලේඛනාගාරය පරිහරණය කිරීමට ඔහුට අවශ්‍ය විය හැකිය. විශේෂයෙන් ම විසිවන සියවසට පෙර කාලය තුල කරනලද පුරෝගාමී පුරාවිද්‍යා අධ්‍යයනයන් පිළිබඳව දැන ගැනීම සඳහා ජාතික ලේඛනාගාරය පරිහරණය කිරීම අත්‍යවශ්‍යය. එකල මෙරට සිදුකරන ලද පුරාවිද්‍යා කටයුතු අළලා ලියවුණු ප්‍රකාශිත සහ අප්‍රකාශිත අධිලේඛන රැසක් ජාතික ලේඛනාගාර ලිපි ගොනු අතර දැකිය හැකිය.

මෙකී ඇතැම් ලේඛනවලින් හෙළිදරව්වන සමහර කරුණු අද වෙනත් කිසිම මූලාශ්‍රයකින් ලබාගත නොහැකිය. එමෙන් ම ඇතැම් පුරෝගාමීන් විසින් ලියන ලද සමහර වාර්තා වත්මන් පුරාවිද්‍යාඥයන් විසින් ලියනු ලබන වාර්තාවන්ට වඩා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක බවින් ඉහළය. තව ද, පුරාස්ථාන සහ කෘතින් එකල සිට මේ දක්වා දිනෙන් දින විපරිණාමය වී ඇතත් ලිඛිත සාධක එසේ විපරිත වී නොමැත.

1890 දී පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව පිහිටවීමට පෙර දිවයිනේ විවිධ ප්‍රදේශවල පුරාවස්තු ගවේෂණය කරනු ලැබුවේ එම ප්‍රදේශවල සිටි සිවිල් නිලධාරීන් විසිනි. ඔවුන්ගේ වාර්ෂික පරිපාලන වාර්තාවල "පුරාවිද්‍යාව" යනුවෙන් වෙනම ඡේදයක් වශයෙන් හෝ "විවිධ කරුණු" යටතේ පුරාවිද්‍යාත්මක ගවේෂණ පිළිබඳව වාර්තාකර තිබීම දැකිය හැකිය. මේ වාර්තාවල පදනම් වූ වඩාත් සවිස්තරාත්මක ලියවිලි ලේඛනාගාරයේ ඇති කච්චේරි ලිපි ගොනුවල අඩංගුව ඇත. තව ද, සිවිල් නිලධාරීන් විසින් පවත්වාගෙන ගිය නිල දින පොත්වල ඔවුන් විසින් එදිනෙදා සංචාරය කරනු ලැබූ පුරාස්ථාන ආදිය පිළිබඳව විස්තර ඇතුළත්ය. විශේෂයෙන්ම ජේ.බ්ලේයාර්, හේ කැමරන්, ජේ.එෆ්.ඩික්සන්, රිස් ඩේවිඩ්ස්, එස්.එම්.බරෝස්, හියු නෙවිල්, ජේ.පී.ලුවිස්, සී.ජේ.ලැමසියර්, ආර්.ඩබ්ලිව්.අයිවර්ස් වැනි සිවිල් නිලධාරීන්ගේ දින සටහන් අතර පුරාවිද්‍යාත්මක කටයුතු අළලා ලියවුණු වැදගත් සහ සිත්ගන්නා සුළු විස්තර රැසක් අඩංගුය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිහිටුවීමට පෙර සහ ඉන් පසුව කලක් ගතවන තුරු ද පුරාණ ස්මාරකවල සංරක්ෂණ කටයුතු සිදු කරනු ලැබුවේ පොදු වැඩ දෙපාර්තමේන්තුව(P: W.D.) මගිනි. මෙම දෙපාර්තමේන්තුවට අයත් අධිලේඛන රැසක් ම ජාතික ලේඛනාගාරයේ තැන්පත් කොට ඇත. එකළ සංරක්ෂණය කරනු ලැබූ ස්මාරක පිළිබඳව සවිස්තරාත්මක කරුණු ලබා ගැනීමට නම් පුරාවිද්‍යාඥයා මේ ලිපිගොනු පරීක්ෂා කළ යුතුව ඇත. තව ද වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවන තුරු (1900) වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කරනු ලැබුවේ ද, මෙම දෙපාර්තමේන්තුව විසිනි. පුරාණ වාරිමාර්ග, පුරාවිද්‍යාඥයාගේ විශේෂ අවධානයට ලක්විය යුතු වුව ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෑතක්වන තුරුම ඒවා පුරාවස්තූන් ලෙස හඳුනාගනු නොලැබීය. එබැවින් පුරාණ වාරි තාක්ෂණය අධ්‍යයනය

කරනු ලබන විද්‍යාඥයකු පරිහරණය කිරීමට සිදුවන්නේ ද රජයේ පොදු වැඩ දෙපාර්තමේන්තුවේ සහ පසුව වාරිමාර්ග සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන ලිපිගොනුය.

මීට අමතරව රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ද දිවයින පුරා මිනුම් කටයුතුවල නිරතව සිටිය දී සොයාගනු ලැබූ පුරාවස්තූන් පිළිබඳව කළ වාර්තා ද ජාතික ලේඛනාගාරයේ එකතුන් අතර වෙයි. මෙරට වනගත ප්‍රදේශවල පිහිටි බොහෝ පුරාවස්තූන් පිළිබඳව ලියන ලද මුල්ම වාර්තා ලෙස ඇත්තේ එම මිනින්දෝරුවන් විසින් සපයනු ලැබූ මෙකී වාර්තාවන් ය.

ඉහත දී ආයතනයන්හී විටින් විට සේවය කළ හෙන්රි පාකර්, එච්.ඩබ්ලිව්. කොඩ්රින්ටන්, ආර්.එල්.බ්‍රෝහියර්, සී.ඩබ්ලිව්. නිකලස් වැනි විද්වතුන් පුරාවිද්‍යාත්මක කටයුතු කෙරෙහි දැඩි ඇල්මක් දක්වා ඇති අතර, ඔවුන් විසින් ලියන ලද වාර්තා සහ දින සටහන් විශාල ප්‍රමාණයක් තවමත් අප්‍රකාශිතව දෙපාර්තමේන්තු ලිපිගොනු තුළ සැඟවී ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා පර්යේෂණ කරන්නෙකු මුලින් ම පරිහරණය කළ යුතු වන්නේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ලියනු ලැබූ වාර්තාවන් නොව වතු වගාකරුවන්, සිවිල් නිලධාරීන්, මානව විද්‍යාඥයින් සහ ස්වභාව විද්‍යාඥයින් විසින් තබන ලද වාර්තාවන් ය. මේ වාර්තාවන් උඩරට වතුවගාව සම්බන්ධ ඇතැම් ලියවිලි අතර ද ජාතික කෞතුකාගාරය සහ ඛනිජ සමීක්ෂණ දෙපාර්තමේන්තුව වැනි ආයතනයන්හී ලිපිගොනු අතර ද ඇත. මේ සම්බන්ධ ඇතැම් වාර්තා එම දෙපාර්තමේන්තුවලින් මෙන් ම ජාතික ලේඛනාගාරයෙන් ද සොයාගත හැකිය.

ජනාවාස පුරාවිද්‍යාව පිළිබඳව මෑතක සිට මෙරට පුරාවිද්‍යාඥයන් අතර යම් උනන්දුවක් ඇති වී ඇත. එම විෂය ක්ෂේත්‍රයට පිවිසෙන යම් පුරා විද්‍යාඥයකු නින්දගම් සහ විහාර දේවාලගම් පිළිබඳව ජාතික ලේඛනාගාරයේ ඇති ලිපිගොනුවලින් විශාල පිටුවහලක් ලබාගනු ඇත. එම ලිපිගොනු අතර ඉඩම් පිළිබඳව විස්තර හැරුණු විට එම ආයතනයන්ට අයත් වූ පැරණි සන්නස් සහ තුඩපත් ආදිය ද අමුණා තිබෙනු දැකිය හැකිය.

මානව වංශ පුරාවිද්‍යාව හදාරන්නෙකු සඳහා ජාතික ලේඛනාගාරයේ ඇති ඕලන්ද තෝම්බු සහ ජන සංඛ්‍යාලේඛන ආදියෙන් කරුණු රැසක් උකහා ගත හැකිය. එමෙන්ම එහි ඇති හියු නෙවිල් එකතුවේ ඡායා පිටපත්වලින් ද, එච්.සී.පී.බෙල් එකතුව සහ ඓතිහාසික අත්ලිපි කොමිෂම මඟින් රැස්කළ සහ පිටපත් කළ විවිධ විෂයන් අළලා ලියැවුණු පුස්කොළ පොත් ආදියෙන් ද කරුණු ලබාගත හැකිය.

මුල් කාලයේ පිටපත් කරන ලද ශිලා ලේඛනවල ස්පර්ශ ලාංඡනවල එකතුවක් ද, පෝල් ගෝල්ඩ්ෂ්මිඩ්ත් සහ එඩ්වඩ් මියුලර් විසින් ලියන ලද අභිලේඛන පිළිබඳ වාර්තාවන් ද, එච්.සී.පී.බෙල් ඇතුළු මුල්කාලීන පුරාවිද්‍යා කොමසාරිස්වරුන්ගේ දිනසටහන් සහ වෙනත් වාර්තාවන් ද පුරාවිද්‍යාඥයින්ගේ විශේෂ අවධානයට ලක්විය යුතු ජාතික ලේඛනාගාර එකතුන් අතර දිටිය හැකිය.

ප්‍රාග් නූතන **(Pre-modern)** සහ නූතන **(Modern)** යුග පිළිබඳව හැදෑරීමේ දී පුරාවිද්‍යාඥයෙකුට ජාතික ලේඛනාගාරයෙන් ලබාගත හැකි පිටුවහල ඇති විශාලය. පුරාවිද්‍යාවේ විෂයපථය ද ඉතිහාසයේ මෙන් දිනපතා වර්ධනය වන අතර පුරාවිද්‍යාව යනු "ඉපැරණි අතීතය" අධ්‍යයනය කරන විෂයපථය ද ඉතිහාසයේ මෙන් දිනපතා වර්ධනය වන අතර පුරාවිද්‍යාව යනු" ඉපැරණි අතීතය" අධ්‍යයනය කරන විෂයයක් යන්න අද යල් පැනගිය අදහසකි. එබැවින් වර්තමාන පුරාවිද්‍යාඥයෝ ප්‍රාග් නූතන යුගය පිළිබඳව ද "එදිනෙදා පුරාවිද්‍යාව" **(Day to Day Archaeology)** පිළිබඳව ද සිය අවධානය යොමු කරති.

යුරෝපීන් පෙරදිගට සංක්‍රමණය වීම නිසා ඇති වූ සංස්කෘතික සම්මිශ්‍රණය හේතුවෙන් සිදු වූ සමාජ භෞතික පරිවර්තනය අද ලෝකයේ ජනප්‍රිය අධ්‍යයන මාතෘකාවක් වී ඇත. මෙවැනි අධ්‍යයනයන් සඳහා ශ්‍රී ලංකාව බෙහෙවින් වැදගත් පර්යේෂණ ක්ෂේත්‍රයක් වන අතර ජාතික ලේඛනාගාරය එහි දී ප්‍රධානතම මූලාශ්‍ර ආයතනයක් ලෙස සැළකිය යුතුය.

කාර්මික පුරාවිද්‍යාව (Industrial Achaeology) මෑතික සිට ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාඥයන් අතර ද සාකච්ඡාවට බඳුන් වූ අධ්‍යයන ක්ෂේත්‍රයකි. මහාමාර්ග, දුම්රිය මාර්ග, පාලම්, කර්මාන්ත ශාලා සහ රථවාහන වැනි කාර්මීකරණය සමග සම්බන්ධ ද්‍රව්‍යමය අතීතය අධ්‍යයනය කිරීම මේ පුරාවිද්‍යාවේ අරමුණය. මේ සඳහා ද පුරාවිද්‍යාඥයාට ජාතික ලේඛනාගාරය පරිහරණය කිරීමට සිදුවීම වැළැක්විය නොහැකිය.

පුරාවිද්‍යාවේ පමණක් නොව, අනෙකුත් විද්‍යාවන්ගේ ද මෑත කාලීන ජනප්‍රිය ප්‍රවණතාවක් වන්නේ එම විෂයයන්ගේ ඉතිහාසය ගැඹුරින් හැදෑරීමය. එහෙත් අවාසනාවකට මෙන් තවමත් ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා කටයුතුවල ඉතිහාසය පිළිබඳව කිසිවෙකුත් ප්‍රමාණවත් අධ්‍ය යනයක් සිදුකොට නොමැත. එවැනි අධ්‍යයනයක දී ජාතික ලේඛනාගාරය ප්‍රධාන මූලාශ්‍ර ආයතනයක් ලෙස පරිහරණය කිරීමට පුරාවිද්‍යාඥයන්ට සිදුවනු ඇත. මෙහි දී ඉහත සඳහන් කරන ලද විවිධ ලිපිගොනු හැරුණු විට රජයේ නිවේදන, ගැසට් පත්‍ර, වාර්ෂික වාර්තා, පරිපාලන වාර්තා, ස්ථානීය වාර්තා, සැසි වාර්තා, අණපනත් සහ ව්‍යවස්ථාදායක සභාවට අදාළ ලියකියවිලි ද සිංහල සහ ඉංග්‍රීසි පුවත්පත් ද රාජකීය ආසියාතික සංගමයේ ලියකියවිලි ඇතුළු අනෙකුත් ශාස්ත්‍රීය ප්‍රකාශන ද පරිශීලනය කළ යුතුව ඇත.